(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක **14**.]

පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

2022 මාර්තු 09 බදාදා පූ.භා. 10.00 ට

පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** වරාය හා නාවික අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා,** විදේශ අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** සංචාරක අමාත්‍යතුමා

ගරු **සී. බී. රත්නායක මහතා,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** සෞඛ්‍ය අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් රාජපක්ෂ මහතා,** තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා, සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍යතුමා සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **බැසිල් රෝහණ රාජපක්ෂ මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** විදුලිබල අමාත්‍යතුමිය

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** අධිකරණ අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා,** ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **තාරක බාලසූරිය මහතා,** කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතා,** කාබනික පොහොර නිෂ්පාදන, ප්‍රවර්ධන හා සැපයුම් නියාමන සහ වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පලතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධන, බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **කපිල අතුකෝරල මහතා**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **තවරාජා කලෙයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **විරාන් අලස් මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **එම්. උදයකුමාර් මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **(මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජීබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රනිල් වික්‍රමසිංහ මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ජෝන් සෙනෙවිරත්න මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු අබ්දුල් හලීම් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු සමන්ප්‍රිය හේරත් මහතා

ගරු මර්ජාන් ෆලීල් මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.

1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම: මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර රෝහල සහ පශ්චාත් වෛද්‍ය උපාධි පුහුණු මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

2. කාරක සභා වාර්තා පිළිගැන්වීම: තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික ගරු නාමල් රාජපක්ෂ මහතා විසින් එකී කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත;

(ii) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(iii) 2016 වර්ෂය සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව;

(iv) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(v) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

3. මහජන පෙත්සම් පිළිගැන්වීම:

(1) (i) මාවනැල්ල, උඩමුල්ල, පේරමඩුල්ල යන ලිපිනයෙහි පදිංචි එච්. ඩී. උදයකුමාර මහතාගෙන් ලැබුණු 2022.01.12 දිනැති පෙත්සම;

(ii) පානදුර, වෑකඩ, සල්ගාදු මාවත, අංක 09 දරන ස්ථානයෙහි පදිංචි ආර්. ඩබ්ලිව්. එස්. කේ. රණවක මහතාගෙන් ලැබුණු 2022.01.11 දිනැති පෙත්සම; සහ

(iii) අලව්ව, කහඹිලියාවල යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. ඒ. අනුර වීරසූරිය මහතාගෙන් ලැබුණු 2022.01.27 දිනැති පෙත්සම

ගරු රංජිත් සියඹලාපිටිය මහතා විසින් පිළිගන්වන ලදී.

(2) අනුරාධපුරය, කාශ්‍යප මාවත, 3 වැනි පියවර, අංක 2354 දරන ස්ථානයෙහි පදිංචි අසේල බණ්ඩාර හිප්පොල මහතාගෙන් ලැබුණු 2021.12.05 දිනැති පෙත්සම ගරු දුමින්ද දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(3) අංකුඹුර, වැලිකැටිය, අංක 39 දරන ස්ථානයෙහි පදිංචි වී. එස්. උඩවෙල මහත්මියගෙන් ලැබුණු 2021.11.29 දිනැති පෙත්සම ගරු අබ්දුල් හලීම් මහතා විසින් පිළිගන්වන ලදී.

(4) ආණමඩුව, පෙරියකුලම, ''හර්ෂණි මිරාන් සෙවන'' යන ලිපිනයෙහි පදිංචි එල්. පී. කරුණාසේන මහතාගෙන් ලැබුණු 2021.12.20 දිනැති පෙත්සම ගරු මායාදුන්න චින්තක අමල් මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

4. පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත් කෙටුම්පත: දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

''පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය''යි අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමා, සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍යතුමා සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

''ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය යුතු ය'' යි තරුණ හා ක්‍රීඩා අමාත්‍ය සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍ය සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ.භා. 11.41 ට ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.30 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

''ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය යුතු ය'' යි අධිකරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.36 ට ගරු හර්ෂණ රාජකරුණා මහතා මූලාසනාරූඪ විය.)

''ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය යුතු ය'' යි අධිකරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.18 ට ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 4.15 ට කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදී.

පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය'' යි අධිකරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ 1 සිට 3 දක්වා පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "(3) IV වන කොටසේ සහ V වන කොටසේ විධිවිධාන හැර, මේ පනතේ අනෙකුත් සියලු විධිවිධාන, (2) වන උපවගන්තියේ සඳහන් පරිදි කථානායකවරයාගේ සහතිකයේ දින සිට මාස දහඅටකට පෙරාතුව නොවන මාස තිස් හයක් නොඉක්මවන දිනයක් විය යුතු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට බලාත්මක විය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 4 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "(4) මේ පනතේ IV වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 7 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "(5) V වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක වන දිනය, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (3) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයකට වඩා පසු දිනයක් නොවන්නා වූ දිනයක් විය යුතු ය".;

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

2 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 2 වැනි පිටුවේ 14 වන පේළිය ඉවත් කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 2 වැනි පිටුවේ 29 වන පේළිය සහ 30 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(2) පිළිවෙළින් (1) වන උපවගන්තියේ (iii) වන සහ (iv) වන ඡේදවල කාර්ය සඳහා";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 3 වැනි පිටුවේ 7 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(3) (අ) යම් පුද්ගලයකු විසින් හුදෙක්ම පෞද්ගලික,";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වන වගන්තියේ සිට 18 වන වගන්තිය දක්වා සභා සම්මත විය.

19 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 13 වැනි පිටුවේ 12 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"සැකසීමෙන් වැළකී නොසිටීමට වූ පාලකවරයාගේ තීරණය";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

20 සහ 21 වන වගන්ති සභා සම්මත විය.

22 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 17 වැනි පිටුවේ 1 වන පේළිය සහ 2 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(අ) පාලකවරයාගේ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 17 වැනි පිටුවේ 5 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ආ) දත්ත සකසන්නාගේ සේවක පිරිස උචිත තාක්ෂණික සහ ආයතනික පියවර ක්‍රියාත්මක කිරීම හරහා විශ්වසනීයත්වය සහ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 17 වැනි පිටුවේ 8 වන පේළියේ සිට 14 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "(ඇ) දත්ත සැකසීමේ ස්වභාවය සහ දත්ත සැකසුම්කරුට පවතින තොරතුරු පිළිබඳ සැලකිල්ලට ගෙන පාලකවරයාගේ ලිඛිත ඉල්ලීම මත පරීක්ෂණ කටයුතු ඇතුලුව අනුකූලතා විගණන කටයුතු කරගෙන යාමට පාලකවරයා වෙත පහසුකම් සලස්වනු ලැබිය යුතු ය;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 17 වැනි පිටුවේ 19 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "දිය යුතු ය.";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 17 වැනි පිටුවේ 20 වන පේළියේ සිට 22 වන පේළිය දක්වා (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

23 වන වගන්තියේ සිට 25 වන වගන්තිය දක්වා සභා සම්මත විය.

26 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 18 වන පේළිය සහ 19 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "වගන්ති යටතේ පනවනු ලැබූ අදාළ වගකීම්වලට අනුකූල වීම අවස්ථාවෝචිත පරිදි එම පාලකවරයා හෝ දත්ත සකසන්නා විසින් සහතික";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 29 වන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "(5) (2) වන උපවගන්තිය ප්‍රකාරව ප්‍රමාණවත් තීරණයක් හෝ (4) වන උපවගන්තිය ප්‍රකාරව උචිත ආරක්ෂණයන් ගෙන නොමැති අවස්ථාවක දී,

(අ) ප්‍රමාණවත් තීරණ සහ උචිත ආරක්ෂණයන් නොමැති වීම හේතුවෙන් දත්ත දායකයාට එම දත්ත සැකසීමෙන් සිදුවිය හැකි අවදානම පිළිබඳ දැනුවත් කිරීමෙන් පසුව, ශ්‍රී ලංකාවෙන් බැහැර පෞද්ගලික දත්තවල යෝජිත දත්ත සැකසීම සඳහා දත්ත දායකයා විසින් ප්‍රකාශිතව ම කැමැත්ත ලබා දී ඇත්නම්;

(ආ) දත්ත දායකයා සහ පාලකවරයා අතර ගිවිසුමක් ඉටු කිරීම සඳහා හෝ දත්ත දායකයාගේ ඉල්ලීමක් මත පාලකවරයා විසින් ගනු ලබන යම් පූර්ව ගිවිසුම්ගත පියවර ක්‍රියාත්මක කිරීම සඳහා දත්ත පැවරීම අවශ්‍ය වේ නම්; හෝ

(ඇ) දත්ත දායකයාට අදාළ නෛතික හිමිකම්පෑම් ප්‍රතිශ්ඨාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ එම හිමිකම්පෑම්වල විත්තිවාචක සඳහා දත්ත පැවරීම අවශ්‍ය වේ නම්; හෝ

(ඈ) මේ පනතේ I වන උපලේඛනයේ (උ) අයිතමයේ අර්ථනිරූපිත මහජන යහපත පිණිස වූ හේතු සම්බන්ධයෙන් දත්ත පැවරීම අවශ්‍ය වේ නම්;

(ඉ) දත්ත දායකයා හෝ වෙනත් තැනැත්තකුගේ ජීවිතය, සෞඛ්‍ය තත්ත්වය සහ ආරක්ෂාව සඳහා තර්ජනයක් වන යම් හදිසි අවස්ථාවක් සඳහා ප්‍රතිචාර දැක්වීමට දත්ත පැවරීම අවශ්‍ය වේ නම් සහ දත්ත දායකයා හෝ ඔහුගේ නෛතික භාරකරු ශාරීරිකව හෝ නෛතික වශයෙන් කැමැත්ත ලබාදීමට නොහැකිව සිටින අවස්ථාවක දී; හෝ

(ඊ) මේ පනත යටතේ නියම කරනු ලැබිය හැකි වෙනත් තත්ත්වයන් යටතේ එම දත්ත සැකසීම සඳහා අවසර ලබාදී ඇත්නම්;

පොදු අධිකාරියක් හැර පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටතදී පෞද්ගලික දත්ත සකස් කරනු ලැබිය හැකි ය.;"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

27 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 27 වැනි පිටුවේ 2 වන පේළිය සහ 3 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ආයාචිත පණිවුඩ පතුරුවා හැරීම සඳහා පෞද්ගලික දත්ත භාවිතා කිරීම";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 23 වන පිටුවේ 27 වන වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"පාලකවරුන් විසින් දත්ත දායකයන් වෙත ලබාදෙන ආයාචිත පණිවුඩ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 23 වන පිටුවේ 31වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(6) මේ වගන්තියේ කාර්යය සඳහා "පණිවුඩයක්" යන්නට, දත්ත දායකයා විසින් පාලකවරයාගෙන් ගාස්තුවක් රහිතව සේවයක් ලබා ගැනීමට කැමැත්ත ලබා දී ඇති යම් අන්තර්ජාල පාදක වූ වෙළඳ ප්‍රචාරක දැන්වීම් හැර මානව";

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

28 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 24 වන පිටුවේ 11 වන පේළියේ සිට 30 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''දත්ත ආරක්ෂණ අධිකාරිය පිහිටුවීම

28. (1) මේ පනතේ කාර්යය සඳහා (මේ පනතේ ''අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා දත්ත ආරක්ෂණ අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු මෙන්ම එකී නාමයෙන් නඩු පැවරීමට සහ නඩු පවරනු ලැබීමට හැකියාව තිබිය යුත්තේ ය.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 25 වන පිටුවේ 1 වන පේළියේ සිට 15 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

29. (1) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම (මේ පනතේ ''මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුත්තේ ය.

(2) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්ය සඳහා, මණ්ඩලය විසින් මේ පනත මගින් අධිකාරිය වෙත යොමුකරනු ලැබ ඇති, පවරනු ලැබ ඇති හෝ පනවනු ලැබ ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(3) ඉංජිනේරු, වෛද්‍ය, බැංකු සහ මූල්‍ය, විදුලි සංදේශ, නීතිය යන ක්ෂේත්‍රවල ප්‍රවීනත්වයට පත් සහ වෘත්තීමය නිපුණතාවක් පෙන්නුම් කර ඇත්තා වූ ද මහජන උපයෝගීතා, ව්‍යාපාර සැකසුම් ලබාගැනීම් (BPO) ලොජිස්ටික්, රක්ෂණ, බැංකු සහ මූල්‍ය යන අංශවල පළපුරුද්දක් ඇත්තා වූ ද යටත් පිරිසෙයින් සාමාජිකයන් දෙදෙනකු රාජ්‍ය අංශයේ ආස්ථිත්වවල පූර්ව පළපුරුද්දක් සහිත තැනැත්තන් වන්නා වූ ද තැනැත්තන් අතරින්, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පහකට අඩු නොවන සහ හත් දෙනකුට වැඩි නොවන සාමාජිකයන් ගණනකින් මණ්ඩලය සමන්විත විය යුත්තේ ය.

(4) මණ්ඩලයට පත් කරනු ලබන තැනැත්තන්ට නියාමනයට සම්බන්ධ කාරණා, පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂණය, තොරතුරු ආරක්ෂණය, දත්ත විද්‍යාව, දත්ත විශ්ලේෂණය, ආර්ථික විද්‍යාව, මුදල්, තොරතුරු තාක්ෂණය හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල පළපුරුද්දක් සහ දැනීමක් ද තිබිය යුතු ය.

(5) මේ පනතේ VI වන උපලේඛනයේ විධිවිධාන, මණ්ඩලයේ සාමාජිකයන්ගේ නුසුදුසුකම් සහ සාමාජිකයන් ඉවත් කිරීම, සාමාජිකයන් ඉල්ලා අස්වීම, සාමාජිකත්වයෙන් ඉවත් වීම හෝ සාමාජිකත්වය අත් හැරීම, සාමාජිකයන්ගේ ධූර කාලය, අධිකාරියේ රැස්වීම් සහ නිල මුද්‍රාව සම්බන්ධයෙන් බලාත්මක විය යුතු ය.

"මණ්ඩලයේ සභාපතිවරයා

30. (1) රාජ්‍ය හෝ පෞද්ගලික අංශ ආස්ථිත්වවල සක්‍රීය නායකත්ව ගුණාංග ප්‍රකට කර ඇති, සාමාජිකයන් අතරින් එක් තැනැත්තකු ජනාධිපතිවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත්කරනු ලැබිය යුතු ය.

(2) ජනාධිපතිවරයා අමතන ලද ලිපියක් මගින් සභාපතිවරයාට ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර එම ඉල්ලා අස්වීමේ ලිපිය ජනාධිපතිවරයා විසින් පිළිගනු ලබන දිනයේ සිට එම ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින් තත්කාර්ය සඳහා හේතු දක්වමින් සභාපතිවරයා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) (2) සහ (3) වන උපවගන්තිවල සඳහන් විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධූර කාලය ඔහු මණ්ඩලයේ සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතු ය.

(5) රෝගාතුර වීම, වෙනත් අශක්නුතාවක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා සභාපතිවරයාට ස්වකීය ධූරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට හෝ ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක දී, සාමාජිකයකුගේ සාමාන්‍ය කර්තව්‍ය ඉටු කිරීමට අමතරව, සභාපතිවරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් වෙනත් යම් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

29 වන වගන්තිය සභා සම්මත විය.

30 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 26 වන පිටුවේ 9 වන පේළියේ සිට 14 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 26 වන පිටුවේ 30 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(ඉ) මේ පනතේ විධිවිධාන ප්‍රකාරව විමර්ශන පැවැත්වීමට, පැමිණිලි භාර ගැනීමට, යම් තැනැත්තකුට අධිකාරිය ඉදිරියේ පෙනී සිටින ලෙස නියම කිරීමට, විධාන නිකුත් කිරීමට සහ දඩ මුදල් පැනවීමට;

(ඊ) ප්‍රතිඥාවක් හෝ දිවුරුමක් යටතේ යම් තැනැත්තකු පරීක්ෂා කිරීමට සහ අවශ්‍ය අවස්ථාවල දී මේ පනතේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා නියම කරනු ලබන ආකාරයකට පාලකවරයකුගේ හෝ දත්ත සකසන්නකුගේ දත්ත සැකසීමේ කර්තව්‍යයන්ට අදාළ වන යම් තොරතුරු ඉදිරිපත් කරන ලෙස එවැනි තැනැත්තකුට නියම කිරීමට;"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 27 වන පිටුව 8 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(උ) නියමිත සුදුසුකම්, පළපුරුද්ද සහ බලතල සහ කාර්ය සහිත සාමාජිකයන්ගෙන් සමන්විත උපදේශක කමිටු පත් කිරීමට;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

31 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 30 වන පිටුවේ 20 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(ච) යම් ලිඛිත නීතියක් යටතේ දත්ත දායකයන්ට සපයනු ලබන අනන්‍යතා කළමනාකරණ සහ ඒ හා සම්බන්ධ සේවා නියාමනය කිරීමේ කාර්යය සඳහා ආංශික මාර්ගෝපදේශ සහ රීති සහ දත්ත සැකසීම සඳහා බලපත්‍රයක් අවශ්‍ය වන පාලකවරයන්ගේ සහ දත්ත සකසන්නන්ගේ ප්‍රභේද සහ බලපත්‍රවල අදාළ උපමාන සැකසීම සඳහා උපදේශක කමිටු පත් කිරීම;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 30 වන පිටුවේ 30 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"අධිකාරිය විසින් බලපත්‍ර නිකුත් කළ හැකි බව

34. (1) යම් ලිඛිත නීතියක් යටතේ දත්ත දායකයන්ට සපයනු ලබන අනන්‍යතා කළමනාකරණ සහ ඒ හා සම්බන්ධ සේවා නියාමනය කිරීමේ කාර්යය සඳහා, උපදේශක කමිටුවේ නිර්දේශ මත, බලපත්‍රයක් අවශ්‍ය වන පාලකවරයන්ට සහ දත්ත සකසන්නන්ට අධිකාරිය විසින්, බලපත්‍ර නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) උපදේශක කමිටුවේ නිර්දේශවල දත්ත සැකසීම සඳහා බලපත්‍රයක් අවශ්‍ය වන පාලකවරයන් සහ දත්ත සකසන්නන්ගේ ප්‍රභේද සහ බලපත්‍රවලට අදාළ උපමාන ඇතුළත් විය යුතු ය.

(3) එම බලපත්‍රවලට අදාළ උපමාන, බලපත්‍ර ප්‍රභේද, නියම සහ කොන්දේසි, ආකෘතිය සහ කාලසීමාව, ඉල්ලුම් කිරීමේ කාර්ය පටිපාටිය, අලුත් කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම, එම බලපත්‍ර ප්‍රතික්ෂේප කිරීම, අත්හිටුවීම හෝ අවලංගු කිරීමට විරුද්ධව අභියාචනය කිරීම සහ අය කළ යුතු ගාස්තු නියමිත ආකාරයෙන් විය යුතු ය.

(4) එම පාලකවරයන් සහ දත්ත සකසන්නන් විසින් එම බලපත්‍රවලට අදාළ නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීම අධිකාරිය විසින් සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම කරනු ලැබිය හැකි ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

32 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 31 වන පිටුවේ 18 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''දැක්වීමට අවස්ථාවක් ලබාදීමෙන් පසුව, නියම කරනු ලැබිය'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 31 වන පිටුවේ 22 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''සිටීමට; හෝ'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 31 වන පිටුවේ 24 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

''(ඇ) (1) වන උපවගන්තිය යටතේ පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් සිදු කරන ලද උල්ලංඝනය කිරීමක ප්‍රතිඵලයක් ලෙස පාඩුවක්, අලාභයක් හෝ හානියක් විඳ ඇති අගතියට පත් තැනැත්තකු අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන පරිදි වන්දි ලෙස යම් මුදලක් ගෙවීමට,'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 32 වන පිටුවේ 1 වන පේළිය සහ 2 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''වෙනත් යම් සමාන මාර්ගයක් මගින් භාරදිය යුතු අතර, එම පාලකවරුන් සහ දත්ත සකසන්නන් එම විධානයන්ගෙන් බැඳී සිටිය යුතු අතර, එම විධානය සන්නිවේදනය කරන ලද දින සිට එම විධානයට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

VI වන කොටස

අධිකාරියේ අධ්‍යක්ෂ - ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ-ජනරාල්වරයා පත් කිරීම

36. (1) මණ්ඩලය විසින්, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු අතර ඔහු රාජ්‍ය අංශයට හෝ පෞද්ගලික අංශයට නායකත්වය ලබාදීමෙහිලා විශිෂ්ටත්වයට පත් සහ වෘත්තීය විශේෂඥතාව පෙන්නුම් කර ඇත්තා වූ ද, තැනැත්තකු විය යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා වියයුතු අතර, පාරිශ්‍රමික ඇතුළු අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ සේවා නියුක්ති කොන්දේසි මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(3) යම් තැනැත්තකු -

(අ) අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් බරපතල විෂමාචාරයකට මින් පෙර වරදකරු ලෙස තීරණය කර ඇත්නම් හෝ නියාමන ආයතනයක් විසින් විනය ක්‍රියාමාර්ගයකට යටත් කර ඇත්නම්;

(ආ) කලින් ධූරයෙන් පහ කරනු ලැබ ඇත්නම්; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන නියෝග, රීති හෝ විධාන කඩ කිරීමක් සිදු කර ඇත්නම්,

එකී තැනැත්තා මණ්ඩලය විසින් අධිකාරියේ අධ්‍යක්ෂ - ජනරාල්වරයා ලෙස පත් කරනු නොලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ සාමාන්‍ය අධීක්ෂණයට සහ පාලනයට යටත්ව, අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින්, අධිකාරියේ කටයුතු සහ ගනුදෙනු මෙහෙයවීම, එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සහ අධිකාරියේ නිලධරයන් සහ සේවා නියුක්තිකයන් පරිපාලනය කිරීම සහ පාලනය කිරීම භාරව කටයුතු කරනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලය විසින්, පහත දැක්වෙන හේතු කිසිවක් සැලකිල්ලට ගනිමින්, (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ - ජනරාල්වරයා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය:-

(අ) අධිකාරිය වෙනුවෙන් ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමේ දී යම් සම්බන්ධතා අතර ගැටුමක් ඇතිවීමේ ඉඩකඩ;

(ආ) ඒ තැනැත්තා සිහි විකල් තැනැත්තකු බවට හෝ ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමට නොහැකි තැනැත්තකු බවට පත්වීම;

(ඇ) ඒ තැනැත්තා ස්වකීය කාර්යන්ට හෝ කර්තව්‍යයන්ට අදාළව බරපතල විෂමාචාරය සම්බන්ධයෙන් වරදකරු වීම; හෝ

(ඈ) ඒ තැනැත්තා ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමේ දී ස්වකීය ස්වාධීනත්වයට බාධා කිරීමට හැකි යම් කටයුත්තකට සම්බන්ධ වීම හෝ මණ්ඩලයේ සාමාන්‍ය විධානවලට අනුකූල නොවීම:

එසේ වුව ද, එකී ඉවත් කිරීමට පෙරාතුව මණ්ඩලය විසින් අධ්‍යක්ෂ-ජනරාල්වරයාට කරුණු දැක්වීමට අවස්ථාවක් දිය යුතු ය.

"අධිකාරියේ කාර්ය මණ්ඩලය

37. (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, අධිකාරිය විසින්, ස්වකීය කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරිම සඳහා එය විසින් අවශ්‍ය යයි සලකනු ලබන පරිදි සේවක සංඛ්‍යාව තනතුරු ඇති කිරිම සහ නිලධරයන් සහ සේවා නියුක්තිකයන් සේවයේ නියුක්ත කිරීම කරනු ලැබිය හැකි ය. තවද, අධිකාරිය විසින්, මේ පනතේ විධිවිධාන යටතේ වන ස්වකීය කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා එම නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ වැටුප් සහ වේතන හෝ ඔවුන්ගේ වෙනත් පාරිශ්‍රමික, ප්‍රතිලාභ සහ විශ්‍රාම වැටුප් නියම කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය විසින්, තොරතුරු සුරක්ෂිතභාවය, දත්ත විද්‍යාව, දත්ත විශ්ලේෂණය, තොරතුරු තාක්ෂණය, මුදල්, නීතිය සහ අනෙකුත් විෂයයන් පිළිබඳ තාක්ෂණික සේවක පිරිස පුහුණු කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා අනුග්‍රහය දැක්වීම කරනු ලැබිය යුතු අතර, මේ කාර්යය සඳහා, අධිකාරිය විසින්, නිශ්චය කරනු ලබන පරිදි කුසලතාව පෙන්නුම් කර ඇති අධිකාරියේ නිලධරයන් සහ සේවා නියුක්තිකයන්ගේ ශ්‍රී ලංකාව තුළ දී හෝ විදේශයන්හි දී සිදු කරන අධ්‍යයන කටයුතුවල වියදම පියවීම සඳහා අධිකාරියට බලය තිබිය යුතු ය.

(3) අධිකාරියේ නිලධරයන්ට සහ සේවා නියුක්තිකයින්ට අදාළ විය යුතු ආචාර ධර්ම පද්ධතියක් අධිකාරිය විසින් සකස් කරනු ලැබිය යුතු ය.

(4) කලින් කලට වෙනස් කිරීමෙන්, පරිච්ඡින්න කිරීමෙන් හෝ සංශෝධනය කිරීමෙන් අධිකාරිය විසින් එම ආචාර ධර්ම පද්ධතිය ප්‍රතිශෝධනය කළ හැකි ය.

(5) යම් තැනැත්තකු -

(අ) අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් බරපතල විෂමාචාරයක් සම්බන්ධයෙන් මීන් පෙර වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක හෝ යම් නියාමන ආයතනයක් විසින් ගනු ලැබූ විනය ක්‍රියාමාර්ගයකට යටත්ව සිට ඇති අවස්ථාවක;

(ආ) මීන් පෙර ධූරයෙන් පහ කරනු ලැබ ඇති අවස්ථාවක; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩ කිරීමක් සිදු කර ඇති අවස්ථාවක,

අධිකාරිය විසින් එම තැනැත්තා අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු නොලැබිය යුතු ය.

(6) අධිකාරියේ ඉල්ලීම පරිදි රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කාල සීමාවක් සඳහා අධිකාරියට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය, නැතහොත් එම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

(7) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන එම නිලධරයා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාල කරගනු ලැබිය යුතු ය.

(8) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත්කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන එම නිලධරයා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

(9) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා රජය වෙනුවෙන් සේවය කිරීම සඳහා එකඟ වී ඇති යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ යොදවන අවස්ථාවක, එම තැනැත්තා විසින් අධිකාරියේ සේවය කරනු ලබන යම් කාලසීමාවක් එම ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා රජයට සිදු කරන ලද සේවාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(10) අධිකාරිය විසින්, එහි නිලධරයන්ගේ හෝ සේවා නියුක්තිකයින්ගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා ඔවුන් වෙනත් රජයේ ආයතනවලට හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි නියාමන අධිකාරීන්ට අනුයුක්ත කිරීමට යෝජනා කරනු ලැබිය හැකි අතර, එය එම ආයතනය සහ අධිකාරිය අතර එකඟ වූ පැවරුමක් මත සිදු විය යුතු ය. අනුයුක්ත කාලසීමාව අධිකාරිය වෙනුවෙන් සිදු කරන ලද සේවාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

33 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 32 වන පිටුවේ 12 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''දඟයකට නොවැඩි දඩ මුදලක් හෝ වන්දි මුදලක් හෝ ඒ දෙකම ගෙවීමට දැන්වීමක් මගින් නියම'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 32 වන පිටුවේ 23 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''සඳහා අධිකාරිය වගකිව යුතු අතර, එසේ එකතු කරන ලද දඩ මුදල් 32 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධානවලට අනුකූල නොවීම හේතුවෙන් අගතියට පත් තැනැත්තාට ගෙවිය යුතු වන්දි මුදල ලෙස එකතු කරන ලද යම් මුදලක් අඩු කිරීමෙන් පසුව'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 34 වන පිටුවේ 2 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කිරීමට:—

''(8) මේ වගන්තිය යටතේ යම් අභියාචනයකට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදනු ලබන තෙක්, අභියාචනාධිකරණයකට ප්‍රතිශෝධන මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමකට අදාළව එම ව්‍යවස්ථාව යටතේ සාදනු ලබන රීති මේ වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම අභියාචනයක් සම්බන්ධයෙන් ම අදාළ කරගනු ලැබිය යුතු ය.'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

34 වන වගන්තිය සභා සම්මත විය.

35 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 35 වන පිටුවේ 16 වන පේළියේ සිට 20 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(40) මේ පනතේ විධිවිධාන සඳහා වන යම් නිදහස් කිරීමක්, සීමා කිරීමක් හෝ බලහීන කිරීමක් සඳහා එකී නිදහස් කිරීම, සීමා කිරීම හෝ බලහීන කිරීම යම් නීතියක් මගින් විධිවිධාන සලසනු ලබන අවස්ථාවක සහ මූලික අයිතිවාසිකම් සහ නිදහස යනාදියෙහි හරයට ගරු කිරීම සඳහා සහ -"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 36 වන පිටුවේ 4 වන සහ 5 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"VIII වන කොටස

අධිකාරියේ අරමුදල

අධිකාරියේ අරමුදල

41. (1) අධිකාරියට (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) (අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල්;

(ආ) මේ පනත යටතේ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී අධිකාරියට ලැබෙන සියලු මුදල්;

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ ගාස්තු වශයෙන් ගෙවනු ලැබිය හැකි සියලු මුදල්; සහ

(ඈ) ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් බැහැරව ඒකාබද්ධ අරමුදලෙන්, රජයෙන් හෝ විදේශ රජයකින් රාජ්‍ය නියෝජ්‍යායතනවලින් සහ බහු පාර්ශ්වික නියෝජ්‍යායතනවලින් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල්.

(3) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී අධිකාරිය විසින් දරන ලද වියදම් පියවා ගැනීමට අවශ්‍ය කරන සියලු මුදල් ප්‍රමාණයන් අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර ගෙවීම් කිරීම අවශ්‍ය වන සියලු මුදල් ප්‍රමාණයන් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) අධිකාරියේ අරමුදලට අයත් මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් අධිකාරිය විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

36 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 36 වන පිටුවේ 9 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"IX වන කොටස

විවිධ'';

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

''වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

37 වන වගන්තිය සභා සම්මත විය.

38 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 36 වන පිටුවේ 21 වන පේළියේ සිට 26 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පැවරීම

44. (1) මණ්ඩලය විසින්, මේ පනත යටතේ එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් ලිඛිතව නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව අධ්‍යක්ෂ - ජනරාල්වරයාට හෝ අධිකාරියේ යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි අතර අධ්‍යක්ෂ - ජනරාල්වරයා හෝ ඒ නිලධරයා විසින් මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන යම් විශේෂ හෝ සාමාන්‍ය විධානවලට යටත්ව ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද යම් පැවරීමක කුමක් සඳහන් වුව ද, මණ්ඩලය විසින් එසේ පවරන ලද එවැනි යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලතල, කාර්ය සහ කර්තව්‍ය පැවරීම

45. (1) අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් මේ පනත යටතේ ඔහුගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් අධිකාරියේ යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය පවරනු ලැබුවේ යම් නිලධරයකු වෙත ද, ඒ නිලධරයා විසින් ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් ලබාදෙනු ලබන යම් විධානවලට යටත් ව, ක්‍රියාත්ම කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සිදුකරන ලද යම් පැවරීමක කුමක් සඳහන් වුව ද, එසේ පවරන ලද යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ සහ ඉටු කිරීමේ බලය අධ්‍යක්ෂ-ජනරාල්වරයාට තිබිය යුතු ය.

අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු වියදම්

46. (1) යම් අධිකරණයක් ඉදිරියේ දී අධිකාරිය විසින් හෝ අධිකාරියට එරෙහිව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී අධිකාරිය විසින් දරන ලද සියලු වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී අධිකාරියට ගෙවන ලද හෝ අධිකාරිය විසින් අයකරගත් ගාස්තු පමණක් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ අධිකාරියේ සාමාජිකයකු, අධ්‍යක්ෂ - ජනරාල්වරයා හෝ යම් නිලධරයෙකු හෝ වෙනත් සේවානියුක්තිකයකු විසින් සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි අනුමාන කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට දී ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාට එරෙහිව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක් ඒ තැනැත්තා එම ක්‍රියාව සිදුකරනු ලැබුවේ සද්භාවයෙන් යුතුව වන බවට අධිකරණය විසින් තීරණය කරනු ලබන්නේ නම්, ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඒ තැනැත්තා විසින් ඒ වියදම් අයකරගනු ලබන්නේ නම් මිස අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරියේ කාර්යසාධනය සමාලෝචනය කිරීම

47. අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියේ කාර්ය සාධනය සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි අධිකාරියේ කටයුතු සහ කාර්යවලට අදාල යම් වාර්තා ඉදිරිපත් කරන ලෙසට අධිකාරියට නියම කරනු ලැබිය යුතු ය.

වාර්ෂික වාර්තාව

48.(1) අධිකාරියේ කාර්යසාධනය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි පරිදි යම් සහායක ලේඛන සමඟ අධිකාරිය විසින් එක් එක් මුදල් වර්ෂය අවසානයේ මාස හයක කාලයක් ඇතුළත ඒ මුදල් වර්ෂය තුළ අධිකාරිය විසින් කරගෙන යන ලද කාර්ය පිළිබඳ වාර්ෂික වාර්තාවක් අමාත්‍යවරයා වෙත භාරදෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ භාරදෙන ලද වාර්තා සහ ලේඛන ලැබුණු දින සිට මාස හයක කාලයක් ඇතුළත ඒ වාර්තාවේ සහ ලේඛනවල පිටපත් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සහා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

39 වන වගන්තියේ සිට 41 වන වගන්තිය දක්වා සභා සම්මත විය.

42 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 37 වන පිටුවේ 24 සහ 25 වන පේළි ඉවත් කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 38 වන පිටුවේ 1 වන පේළියේ සිට 3 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කිරීමට.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

43 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 38 වන පිටුවේ 6 වන පේළියේ සිට 8 වන පේළිය දක්වා වූ පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "(අ) විවිධ නිලධරයන්ගේ පත්කිරීමේ යෝජනා ක්‍රම, පත්කිරීම්වල නියම, සේවා නියුක්තිය සහ සේවයෙන් ඉවත් කිරීම සහ අධ්‍යක්ෂ - ජනරාල්වරයාගේ බලතල සහ කර්තව්‍ය ඇතුළුව ඒ විවිධ නිලධරයන්ගේ බලතල, කර්තව්‍ය සහ පාරිශ්‍රමික ගෙවීම;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

44 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 39 වන පිටුවේ 32 පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

> "(ඇ) මේ පනත යටතේ නිකුත් කළ යුතු බලපත්‍ර වර්ග සහ උපමාන නිශ්චිතව දක්වමින්;
>
> (ඉ) ඒ බලපත්‍රවල නියම, කොන්දේසි, ආකෘතිය සහ කාලය, අයදුම් කිරීම සඳහා වන කාර්ය පටිපාටිය, අලුත්කිරීම, තාවකාලිකව අත්හිටුවීම, අහෝසි කිරීම සහ ඒ බලපත්‍ර ප්‍රතික්ෂේප කිරීමට, තාවකාලිකව අත්හිටුවීමට හෝ අහෝසි කිරීමට එරෙහිව අභියාචනා කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සලස්වමින්;
>
> (ඊ) බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන ගාස්තු අයකරමින්;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

45 වන වගන්තිය සහ 46 වන වගන්තිය සභා සම්මත විය.

47 වන වගන්තිය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 42 වන පිටුවේ 13 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

" "ළමයා" යන්නෙන්, වයස අවුරුදු දහසයට අඩු ස්වාභාවික";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 42 වන පිටුවේ 24 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"නෛතික තැනැත්තකු, පොදු අධිකාරියක්, රාජ්‍ය සංස්ථාවක්, රාජ්‍ය";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 44 වන පිටුවේ 24 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"මූල්‍ය දත්තයක්, ස්ථානීය දත්තයක් හෝ යම් මාර්ගගත";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 47 වන පිටුවේ 5 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"ආයතනයක්, ව්‍යවස්ථාපිත";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 47 වන පිටුවේ 10 වන පේළියේ සිට 16 වන පේළිය දක්වා වූ පේළි (එම පේළි දෙක ද ඇතුළත් ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"වෙනත් අධිකාරියක් හෝ ආයතනයක් අදහස් වේ;";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 47 වන පිටුවේ 32 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"පෞද්ගලික දත්ත, යම් ස්වාභාවික";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

48 වන වගන්තිය සභා සම්මත විය.

I වන උපලේඛනය සභා සම්මත විය.

II වන උපලේඛනය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 51 වන පිටුවේ II වන උපලේඛනයේ (ඊ) වන අයිතමය ඉවත් කර පහත දැක්වෙන අයිතමය ඇතුළත් කිරීමට:—

> "(ඊ) දත්ත දායකයාගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් සුදුසු සහ විශේෂිත පියවර සපයන අතරතුර දී අනුගමනය කරනු ලබන ඉලක්කය සඳහා අවශ්‍ය විය යුතු සහ ඊට සමානුපාතික විය යුතු, යම් ලිඛිත නීතියක හෝ I වන උපලේඛනයේ (උ) වන අයිතමය යටතේ නිශ්චය කර ඇති පරිදි මහජන යහපත සඳහා විධිවිධාන සලස්වා ඇති පරිදි යම් කාර්යයක් සඳහා දත්ත සැකසීම අවශ්‍ය වන විට; හෝ";

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

"උපලේඛනය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

III සිට V දක්වා උපලේඛන සභා සම්මත විය.

VI වන උපලේඛනය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 55 වන පිටුවේ V වන උපලේඛනයට ඉක්බිතිවම පහත දැක්වෙන උපලේඛනය ඇතුළත් කිරීමට:—

"(29 (5) වන වගන්තිය)

VI වන උපලේඛනය

සාමාජිකයන්ගේ ධූර කාලය

1. සභාපතිවරයා හැර අධිකාරියේ සෑම සාමාජිකයකු ම මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ස්වකීය ධූරය කලින් හිස් කළහොත් මිස, ඔහු පත්කළ දින සිට වසර තුනක කාලයක් සඳහා ධූරය දැරිය යුතු අතර, ඔහු ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය:

එසේ වුව ද, මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ධූරය හිස් කරන ලද සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු විසින් ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධූරය දැරිය යුතු ය.

අධිකාරියේ සාමාජිකයන් ඉල්ලා අස්වීම

2. (1) අධිකාරියේ යම් සාමාජිකයකුට, ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් කවර හෝ අවස්ථාවක ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් පිළිගනු ලැබීමෙන් පසුව බලාත්මක විය යුතු ය.

(2) යම් සාමාජිකයකු මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන්, ඉවත් කිරීමෙන් හෝ 29 වන වගන්තියේ (3) වන හෝ (4) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙන් ධූරය හිස් කරනු ලබන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් 28 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධූරය දැරීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයා හැර අධිකාරියේ යම් සාමාජිකයකු රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැර වීම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් මඟින් මාස තුනක් ඉක්මවන කාල සීමාවක් සඳහා තාවකාලිකව ස්වකීය ධූරයේ කාර්ය ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් 29 වන වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින්, එකී කාලසීමාව සඳහා ඔහුගේ ධූරයේ කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(4) කලින් අවසර ලබා ගැනීමෙන් තොරව, මණ්ඩලයේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණෙන මණ්ඩලයේ යම් සාමාජිකයකු ස්වකීය ධූරය අත්හැර ගියාක් සේ සලකනු ලැබිය යුතු ය.

නුසුදුස්සකු වීමට සහ ඉවත් කිරීමට හේතු

3. (1) යම් තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ එසේ පත් වුවහොත්;

(ආ) සිහිවිකල තැනැත්තකු හෝ ස්වකීය කාර්ය කරගෙන යාමට නොහැකි තැනැත්තකු වන්නේ නම් හෝ එසේ වුවහොත්;

(ඇ) නිදහස් කරනු නොලැබූ බංකොලොත් වූවකු වන්නේ නම් හෝ එසේ පත් වී ඇත්නම්;

(ඈ) චරිත දූෂණය හා සම්බන්ධ වරදකට වරදකරු වන්නේ නම් හෝ වරදකරු කරනු ලැබ ඇත්නම්;

(ඉ) කලින් ධූරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම්;

එම තැනැත්තා අධිකාරියේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් අඛණ්ඩව කටයුතු කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

(2) අධිකාරියේ සාමාජිකයකු -

(අ) ස්වකීය කාර්යයන්ට අදාළව බරපතල විෂමාචාරයකට වරදකරු වන්නේ නම්;

(ආ) ස්වකීය ධූරය අඛණ්ඩව කරගෙන යාම අධිකාරියේ යහපතට හානියක් වන පරිදි ස්වකීය තනතුර අයුතු ලෙස භාවිත කරන්නේ නම්;

(ඇ) 3 වන අයිතමයේ (1) වන ඡේදය යටතේ නුසුදුස්සකු වන්නේ නම්; හෝ

(ඈ) මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරන්නේ නම්,

අමාත්‍යවරයා විසින් ඔහු සාමාජිකයකු වශයෙන් අඛණ්ඩව කටයුතු කරගෙන යාමෙන් ඉවත් කළ යුතු ය.

සාමාජිකයන් විසින් යම් සම්බන්ධතාවක් අනාවරණය කළ යුතු බව

4. අධිකාරිය විසින් යම් කාරණාවක් සම්බන්ධයෙන් ගනුලැබිය යුතු යම් තීරණයකට ඍජුව හෝ වක්‍රව සම්බන්ධතාවක් දක්වන සාමාජිකයන් විසින්, එම සම්බන්ධතාවයේ ස්වභාවය පිළිබඳ එම තීරණය ගනු ලබන රැස්වීමේ දී අනාවරණය කරනු ලැබිය යුතු අතර, එකී අනාවරණය කිරීම අධිකාරියේ රැස්වීම්වල සටහන්වල වාර්තා කරනු ලැබිය යුතු ය. තවද එකී සාමාජිකයා එම කාරණයට අදාළව අධිකාරියේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගී නොවිය යුතු අතර එවැනි සාකච්ඡාවක් සිදු කෙරෙමින් පවතින හෝ එවැනි තීරණයක් ගනිමින් පවතින අතරතුර දී යම් රැස්වීමකින් ඔහු ඉවත් විය යුතු ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

5. අධිකාරියේ සාමාජිකයන්ට මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා යම් ආකාරයකට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර අමාත්‍යවරයා විසින් කලින් කලට නිශ්චය කරනු ලැබිය හැකි යම් නියමයන්ට සහ කොන්දේසිවලට යටත් ඔවුන්ගේ කර්තව්‍ය සිදු කරගෙන යනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ ගණපූරණය සහ රැස්වීම

6. (1) අධිකාරියේ යම් රැස්වීමක ගණපූරණය සභාපතිවරයා ඇතුළුව සාමජිකයන්ගෙන් තුනෙන් එකක් විය යුතු ය.

(2) මණ්ඩලයේ සියලු රැස්වීම් අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් කැඳවනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීමක් -

(අ) ඒ රැස්වීම සඳහා නියම කරගත් ස්ථානයේ, දිනයේ සහ වේලාවේ රැස්ව සිටින ගණපූරණය සංයුක්ත කරන සාමාජිකයන් සංඛ්‍යාව විසින්; හෝ

(ආ) ඒ රැස්වීම පැවැත්වෙන කාලසීමාව තුළ, ඊට සහභාගී වන ගණපූරණය සංයුක්ත කරන සියලුම සාමාජිකයන්ට ඊට සහභාගී වන එක් එක් සාමාජිකයා එකවර දැකිය හැකි සහ ඒ එක් එක් සාමාජිකයාට සවන් දිය හැකි ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනයක් මගින්;

පවත්වනු ලැබිය හැකි ය.

(4) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සියලු ප්‍රශ්න එකී රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) මණ්ඩලයේ සෑම රැස්වීමක දී ම සභාපතිවරයා විසින් මුලසුන දරනු ලැබිය යුතු ය. සභාපතිවරයා මණ්ඩලයේ යම් රැස්වීමකට නොපැමිණ ඇති අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන යම් සාමාජිකයකු විසින් මණ්ඩලයේ එම රැස්වීමේ මුලසුන දරනු ලැබිය යුතු ය.

(6) මණ්ඩලයේ රැස්වීම්, කලින් කලට එය විසින් සාදනු ලබන රීති සහ පිහිටුවනු ලබන කාර්ය පටිපාටිවලට අනුකූලව පවත්වනු ලැබිය යුතු ය.

පුරප්පාඩුවක් පැවතීම හේතුවෙන් කටයුතු, ක්‍රියාවන් හෝ තීරණ අවලංගු නොවිය යුතු බව

7. අධිකාරියේ කිසිඳු කටයුත්තක්, ක්‍රියාවක් හෝ තීරණයක් එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි යම් සාමජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීම හේතුවෙන් ම පමණක් අවලංගු නොවිය යුතු ය.

අධිකාරියේ මුද්‍රාව

8. (1) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය භාරයේ තැබිය යුතු ය.

(2) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ එක් සාමාජිකයකු සහ අධිකාරියේ අධ්‍යක්ෂ - ජනරාල්වරයා ඉදිරිපිට දී හෝ අධ්‍යක්ෂ - ජනරාල්වරයා නොපැමිණෙන අවස්ථාවක දී මණ්ඩලයේ යම් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිඳු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට හෝ අධිකාරියේ මුද්‍රාව නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණි බවට සළකුණක් වශයෙන් එකී සාධන පත්‍රයේ හෝ ලේඛනයේ තම නම අත්සන් කළ යුතු ය.

(4) මණ්ඩලය විසින් අධිකාරියේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳව රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු ය.

''උපලේඛනය දෙවැනිවර කියවිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

උපලේඛනය පනත් කෙටුම්පතට එකතු කළ යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

දීර්ඝ නාමය

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් අධිකරණ අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: ''නම් කිරීම'' යන වචනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

''පිහිටුවීම''.

''සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

''දීර්ඝ නාමය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

''ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'', යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත සංශෝධන සහිතව දැන් තෙවැනිවර කියවිය යුතු ය"යි අධිකරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවා සම්මත කරන ලදී.

5. සිසිර ජයකොඩි සියපත පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත: දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි අධ්‍යාපන අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනිවර කියවන ලදින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 53(3) යටතේ කථානායකවරයා විසින් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

6. කල් තැබීම (කල්මුණේ-උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යෑම): "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි වාරිමාර්ග අමාත්‍යතුමා, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 5.22 ට ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබූයෙන් අද දින සභා සම්මතිය අනුව අ.භා. 6.03ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තබන ලදී.

පාර්ලිමේන්තුව, ඊට අනුකූලව 2022 මාර්තු 10 බ්‍රහස්පතින්දා පූ.භා. 10.00 වනතෙක් කල් ගියේය.